# 2009 න් පසු ශ්‍රී ලංකාවේ සිංහල හා මුස්ලිම් අර්බුදයේ ආගමික බලපෑම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

තිලිණි අරෝෂා කුමාරසිරි[1]

තිස් අවුරුද්දක කාලයක් තිස්සේ වාර්ගික අර්බුදයෙන් බැට කෑ ශ්‍රී ලංකා සමාජය වර්තමානයේ ආගමික සාධකය මුල් කරගනිමින් ගැටුම් නිර්මාණය වෙමින් පවතින සමාජයකට මුහුණ දෙමින් සිටියි. ගැටුමක් නිර්මාණය වීමේදී සමාජ, ආර්ථික, දේශපාලන සාධක සේම බහු ආගමික, බහුවාර්ගික, බහු භාෂාමය සාධකයන්ගේ බලපෑම ද අතිමහත් වේ. එසේ නිර්මාණය වන ගැටුම් දිග්ගැස්සුණු සමාජ ගැටුම් බවට විපරිවර්තනය වීමේ වැඩි ප්‍රවණතාවයක් ලෝකයේ සෙසු කලාපයන්ට සාපේක්ෂව දකුණු ආසියානු කලාපයේ දැක ගත හැකි වේ. එම කලාපයේ රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ද ගැටුම් නිර්මාණය වීම කෙරෙහි ඉහත සඳහන් සාධක බලපා ඇති අතර වර්තමානයේ එම සාධක අතර ආගමික සාධකයේ බලපෑම ප්‍රබල වෙමින් පවතී. මෙම තත්ත්වය 2009 වසරින් පසු වැඩි වශයෙන් දැක ගැනීමට හැකි අතර විශේෂයෙන් සිංහල බෞද්ධ ජනයා හා ඉස්ලාම් ජනතාව අතර එම තත්ත්වය උග්‍ර තත්ත්වයට පත් වී ඇති බවක් පෙනෙන්නට තිබේ. ඉස්ලාම් ආගමික ජනකණ්ඩායම් හා බෞද්ධ ආගමික කොට්ඨාශයන් විසින් විවිධ සංවිධාන පිහිටුවා ගනිමින් දැවැන්ත විරෝධතා ගෙන යමින් ආගමික වශයෙන් සමාජයේ ගැටුම් නිර්මාණය කිරීම එහි සුවිශේෂී ලක්ෂණයක් වී තිබේ. ඒ අනුව මෑත කාලයේ ශ්‍රී ලංකාවේ බෞද්ධ ආගමික ජනකණ්ඩායම් හා ඉස්ලාම් ආගමික ජන කණ්ඩායම් අතර මත භේදාත්මක වශයෙන් අර්බුදයක් හට ගෙන තිබේ. මෙම පසුබිම අනුව පශ්චාද් යුධ කාලීන අවධියේ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීමෙහිලා ආගමික සාධකය බලපා ඇත්තේ ඇයි ද යන්න පිළිබඳ මෙම අධ්‍යයනය මඟින් විමර්ශනය කෙරේ. එහිදී උචිත ක්‍රමවේද භාවිත කරමින් අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ විෂය ක්ෂේත්‍රයට අදාළ පොත්පත්, සඟරා, පුවත්පත් මගින් හා අන්තර්ජාලය ඇසුරින් රැස් කරගනු ලැබූ ද්විතීයික දත්ත භාවිත කෙරේ. ශ්‍රී ලංකාවේ බේරුවල, අළුත්ගම ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් ප්‍රශ්නාවලි ක්‍රම භාවිතයෙන්, සම්මුඛ සාකච්ඡා භාවිතයෙන් සිදු කරනු ලැබූ සමාජ පර්යේෂණයන් මඟින් ලබා ගනු ලැබූ ප්‍රාථමික දත්ත භාවිත කෙරේ. මෙම අධ්‍යයනය මඟින් පශ්චාද් යුධ කාලීන සමාජයක ගැටුම් නිර්මාණය වීමෙහිලා පවතින ඉඩ ප්‍රස්ථාවන් වැඩිවීම, මහජන කොට්ඨාශය වශයෙන් සිංහල බෞද්ධ ජනකොට්ඨාශ ආගමික වශයෙන් සිදු වන විරුද්ධවාදකම් නොඉවසීම, ආගමික සාධක ගැටුම් නිර්මාණය වීමෙහිලා බලපාන සංවේදී සාධකයක් වේ. ඉස්ලාම් ජනගහනයේ සීඝ්‍ර වර්ධනය යනාදී කාරණා මෙවැනි පසුබිමක් නිර්මාණය වීමෙහිලා බලපෑම් කර ඇති බව හඳුනාගනු ලැබේ.

**ප්‍රමුඛ පද :** වාර්ගික අර්බුදය, සිංහල හා මුස්ලිම් අර්බුදය, ගැටුම්, ආගමික සාධක, බෞද්ධාගම

1 නිබන්ධක, දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Email : thiliniarosha@gmail.com